

# ලදී

කතාව සහ චිත්‍ර
ඊ.ජී.ජී තනුලි නිමංසා
අතාවුද

CamScanner

# පිදුම

අකුරු හඳුනා දෙමින් .....
එකිනෙක ගලපා ...........
වචන ලියන්නට ............
මා හට කියා දුන්..........
මගේ ආදරණීය ගුරු ....
මෑණිවරුන් වන
මංජුලා ගුරුතුමියට.....
ගයනී ගුරුතුමියට......
බැති සිතින්
පිළිගන්වමි....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ ගම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 . 11 . 01



CamScanner



අම්මාටයි ,තාත්තයි
වැඩට ගිහින් පුංචි
මලී තනියම
හිටියේ .සෙල්ලම්
කරන්න මිදුලට ගියා .



CamScanner

මලී ලස්සන සමනලයෙක් දැක්කා. මලී සමනලයා පසුපස ගියා.





දන්නේම නැතිව පුංචි
මලී කැලේටම ඇවිත්
පාට පාට මල්,
කුරුල්ලෝ, පාට පාට
සමනල්ලු ,ගෙඩි
පිරුණු පලතුරු ගස්
මලී දැක්කා .



CamScanner



ගෙඩි පිරුණු පේර
ගහක් මලී දැක්කා.
ගෙඩියක් කඩා ගෙන
රස බැලුවා. හරි ම
රසයි කියලා මලීට
හිතුණා .



CamScanner

මලී සතුටින්
ඉදිරියට ම
ඇවිදගෙන
යනකොට ලස්සන
මල් යායක් දැක්කා .





මල් ටිකක් කඩා
ගන්න ඕනේ අම්මාට
මලී හිතුවා .



CS CamScanner

මල් කඩමින් සිටින විට හොඳටම හවස වුණා .





CamScanner

මලීට බය
හිතුණා .මලී
හොඳටම අඬන්න
ගත්තා. අම්මයි
තාත්තයි මලී
හොයන්න වුණා .





CamScanner



පුතේ ඔයා කොහෙද
ඉන්නේ අම්මා
කෑගැසුවා. මලීට ඒ
හඬ ඇසුණා.අම්මේ
මම මෙහේ මලී
කිවුවා .



මලී අම්මයි තාත්තයි
ළඟට දුවගෙන ගියා.

අම්මාටයි තාත්තායි
කියන්නේ නැතිව
ආයේ කවදාවත්
කොහේවත් යන්න
එපා. අම්මා මලීගේ
ඔළුව අත ගා
කිවුවා .මලී "හා"
කියලා කිවුවා .





CamScanner



"පුංචි අපිත් අපේ අම්මාට
තාත්තාට කීකරු අවවාද
පිළිගන්න හොඳ දරුවෝ වෙමු."



CamScanner

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පෙරළිකාරකයන් පරිපූරකාවරණය පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරමින් ඔවුන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ භාෂාත්මක නිර්මාණ හැකියාවන් වර්ධනය කිරීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ලේඛක කරණයට යොමුකරන ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ සමයේ වැඩි ම ලේඛක ප්‍රමාණයක් රචනා කරමින් ව්‍යාපෘතියේ සාර්ථකත්වය මහාමායා දුංවි ගන්නගුවේගෙන් ග. පාසල සුදු සොයිසාගේ ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවැනි ජාත්‍යන්තර තරඟයක් වෙත ලුහුබැඳීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. එ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සම්භාරයක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ සැඟවී ඇති නිර්මාණාත්මක හැකියාවන් සාර්ථක ලෙස ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දියුණුවට මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රකාශන සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සැඩී මෙම ව්‍යාපෘතියේ පිටුපස වූ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව මම ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට එක්වල් වෙද්‍යාවට පිවිසි ගන්නගුව අංකුර සාහිත්‍ය ලොකය දිනන ලේඛිකාවරුන්ගෙනු ඔබට ශක්තිය ලැබේවායි පතමි . .

මෙයට

සෙනෙවිරත්න මහත්මිය

පාසල් දරුවන් ලේඛකකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01